# රත්නපුර ප්‍රාදේශිය සභාව 2022.08.12 වන දින මහා සභා රැස්වීම් වාර්තාව

රත්නපුර ප්‍රාදේශිය සභාවේ මහා සභා රැස්වීම 2022.08.12 වන දින පෙ.ව.10.00 ට ගරු සභාපතිතුමාගේ ප්‍රධානත්වයෙන් රත්නපුර ප්‍රාදේශීය සභාවේ සභා රැස්වීම් ශාලාවේදී පැවැත්විණි.

| අනු අංකය | නම | තනතුර |
|---|---|---|
| 01. | ඩබ්ලිව්.ඩී.සුදත් දිසානායක මහතා | ගරු සභාපති |
| 02. | ජී.ජී.ජානක පුෂ්ප කුමාර මහතා | ගරු උප සභාපති |
| 03. | ටී.ප්‍රේමතිලක මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 04. | එන්.විජය ශ්‍රී ශාන්ත මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 05. | ජී.එච්.රංජිත් ධර්මකීර්ති මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 06. | අයි.වී.අකිල රෝෂන් ලක්මාල් මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 07. | කේ.රණවක කළුආරච්චි මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 08. | ටී.කේ.ජී.ප්‍රියන්ත පෙරේරා මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 09. | ඒ.දොන්.නිශාන් දමිත් අල්ගම මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 10 | යූ.කේ.නන්දාවතී මහත්මිය | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 11. | එම්.ඒ.ඩික්සන් ජයතිලක මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 12. | ආර්.බී.නාලක සුදත් ශ්‍රී හේමපාල මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 13. | ඒ.එම්.නිලන්ති මහත්මිය | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 14. | මංජුල ශ්‍රීලාල් බී ගමගේ මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 15. | පී.වී.ඉන්දික ලක්ෂ්මන් විතාරම මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 16. | ඒ.එම්.සමන් පාලිත විජේරත්න මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 17. | කේ.වී.කමනි සේනාධීර මහත්මිය | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 18. | කේ.නිරෝෂන් ලක්මාල් මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 19. | බී.ඒ.ලලිත් බෝතුංග ආරච්චි මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 20. | ඩී.නිලන්ති දීපිකා යසරත්න මහත්මිය | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 21. | පී.වී.ඉසුරු ජයලත් විතාරණ මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 22. | ජී.ජී.ලිලානි චන්ද්‍රතිලක මහත්මිය | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 23. | ජී.අනුර ප්‍රභාත් අමරවංශ මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 24. | පී.රොහාන් ශ්‍රියන්ත කුමාර මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 25. | එම්.වජිරා නන්දනී මහත්මිය | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 26. | එල්.එම්.තමරා සුභාෂිණී මහත්මිය | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 27. | කේ.ජී. නිහාල් අමරසිංහ මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 28. | ආර්.ඒ.පත්මා නන්දනී මහත්මිය | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 29. | රාමසාමි මෝහන සුන්දරම් මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 30. | ජී.වී.අනූෂ විරාජ් මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |

**සහභාගී නොවූ ගරු මන්ත්‍රීතුමන්ලා/ තුමියන්ලා**

| | | | |
|---|---|---|---|
| 01. | ගෝපාල් තම්බිරාජා මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී | - |
| 02. | කේ.ඒ.ජයරත්න මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී | |
| 03. | ඕ.කේ.සුගත් ජයවික්‍රම මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී | |
| 04. | බී.ප්‍රියන්ත මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී | |
| 05. | පී.උදය කුමාර් මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී | |
| 06. | ටී.ජී.ඉන්ද්‍රාණි මැණිකේ මහත්මිය | ගරු ප්‍රා/ස/මන්ත්‍රී | |

**සහභාගී වූ නිලධාරීන් :-**

01.ජී.යූ.එම්.සී.සිරිවර්ධන මහත්මිය - ලේකම්

02.ජී.එච්.අයි.ඩී.ආරියමිත්‍ර මහත්මිය - සංවර්ධන නිලධාරී

**01.පසුගිය රැස්වීමේ වාර්තාව සම්මත කිරීම.**

2022.07.15 වන දින මහා සභා වාර්තාව සභා සම්මත කිරීම සුදුසු බව ගරු සභාපතිතුමා විසින් යෝජනා කරන ලදුව, එම යෝජනාව ගරු මන්ත්‍රී විජය ශ්‍රී ශාන්ත මහතාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**02.සභාපතිවරයා විසින් කරනු ලබන විශේෂ නිවේදන**

නැත

03.ප්‍රාදේශිය සභාව අමතා එවන ලද සංදේශ,පෙත්සම්, පැමිණිලි හා සංනිවේදන සභාව ඉදිරියේ තැබීම.

නැත

**04.යථා පරිදි කල්දී ඇති ප්‍රශ්න**

නැත

**05.යථා පරිදි කල් දී ඇති යෝජනා**

i. දූරෙක්කන්ද හීන්මැණිකේ මියගේ නිවස අසල සිට වාමර මයාගේ නිවස දක්වා මාර්ගය ගල් කැඩීම සිදුකර පාර සෑදීම ව්‍යාපෘතිය සිදුකිරීමේ යෝජනාව ඉටු කිරීම සුදුසු බැවින් එය අනුමත කිරීම සුදුසු බව ගරු සභාපතිතුමා විසින් යෝජනා කරන ලදුව, එම යෝජනාව ගරු මන්ත්‍රී විජය ශ්‍රී ශාන්ත මහතාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

ii. කැටවල සේවා පියසේ ජලය ගලා යන කාණුව හියුම් පයිප්ප යොදා සකස් කිරීම සුදුසු බව ගරු සභාපතිතුමා විසින් යෝජනා කරන ලදුව, එම යෝජනාව ගරු මන්ත්‍රී රණවක කළු ආරච්චි මහතාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

iii. මේ වන විට අබලන්ව ඇති ගුරුබැවිලාගම මාර්ගය අළුත්වැඩියා කිරීම සුදුසු බව ගරු සභාපතිතුමා විසින් යෝජනා කරන ලදුව, එම යෝජනාව ගරු මන්ත්‍රී ඉන්දික ලක්ෂ්මන් විතාරන මහතාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

iv. මනනගෙවත්ත නවනගර මාර්ගය සංවර්ධනය කිරීම අනුමත කිරීම සුදුසු බව ගරු සභාපතිතුමා විසින් යෝජනා කරන ලදුව, එම යෝජනාව ගරු මන්ත්‍රී ඩික්සන් ජයතිලක මහතාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**05:01 හදිසි යෝජනා**

i. රත්නපුර ප්‍රාදෙශිය සභා බල ප්‍රදේශයේ කොට්ඨාශ කිහිපයක පසුගිය භංවතුර හා නාය යෑම් ආපදා තත්වයන් හේතුවෙන් විනාශයට ලක්ව ඇති මාර්ග , පාලම්, බෝක්කු ආදිය පිළිසකර කර ගැනීම සඳහා ගරු ආණ්ඩුකාරතුමාගේද අනුමැතිය ඇතිව සිදුකිරීම සුදුසු බව ගරු සභාපතිතුමා විසින් යෝජනා කරන ලදුව , අදාල කොට්ඨාශවල ගරු මන්ත්‍රීවරුන්ගේ ඉල්ලීම් වෙනුවෙන් එම යෝජනාව ගරු මන්ත්‍රී විජය ශ්‍රී ශාන්ත මහතාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**06.කාරක සභාවල වාර්තා**

2022.07.22 මුදල් කාරක සභා වාර්තාව හා 2022.08.10 දින මුදල් කාරක සභා වාර්තාව අනුමත කිරීම සුදුසු බව ගරු සභාපතිතුමා විසින් යෝජනා කරන ලදුව, ගරු උප සභාපතිතුමාගේ ස්ථිරත්වයෙන් සභා සම්මත කරන ලදී. 2022.07.22 මුදල් කාරක සභාවේ තීරණ අංක 01 සඳහා විපක්ෂයේ විරෝධය එල කරන බවත්, තීරණ අංක 02 සඳහා ගරු සභාපතිතුමාගේ පැහැදිලි කිරීමක් අවශ්‍ය බවත්, 2022.08.10 වන දින වාර්තාවේ ඇති ඇතැම් බිල් ප්‍රමාද වී ගෙවීම් කිරීමට හේතු සඳහන් කරන ලෙසත්,ඒ සඳහා වගකිව යුතු අය කවුරුන්ද යන්න සොයා බලන ලෙසත්, ගරු මන්ත්‍රී රොහාන් ශ්‍රියන්ත මහතා විසින් ඉල්ලා සිටින ලදී.

**07.ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ**

මාසික ආදායම් හා වියදම් සාරාංශ වාර්තාව මහා සභාවට ඉදිරිපත් කරන ලදී.

**08.**ගරු මන්ත්‍රීතුමන්ලාගේ හා ගරු මන්ත්‍රීතුමියන්ලාගේ කතා

**i. ගරු මන්ත්‍රී රොහාන් ශ්‍රියන්ත මහතා**

ගල්ලැල්ල රෝහල සම්බන්ධව සෞඛ්‍ය අධ්‍යක්ෂ වෙත යොමු කරන ලද ලිපිය පිළිබඳව මේ වන විට තත්වය කුමක්ද යන්නත් ඒ පිළිබඳව කිසිදු ක්‍රියා මාර්ගයක් මේ වන විට ගෙන නොමැති නම් යළිත් සිහි කැඳවීමක් හෝ යොමු කිරීමට අවධානය යොමු කරන ලෙස ගරු සභාපතිතුමාගෙන් ඉල්ලීමක් කළේය.

මේ වන විට අබලන්ව ඇති මාර්ග සියල්ල පිළිසකර කරනවා නම් හොඳයි. සභාවේ මුදල් නොමැති නිසා ශ්‍රමදානයක් හෝ සම්බන්ධ කරගනිමින් කටයුතු කරමුයැයි යෝජනා කළේය. පස් ඉවත් කිරීම සඳහා ජේසීබී කිහිපයක් යොදා ගැනීම සුදුසු බවත්, ඒ සඳහා මිළ ගණන් කැඳවා අවම මිළ ගණන් ඉදිරිපත් කරන අයගේ වාහන ලබාගෙන කටයුතු කිරීම සුදුසු බවට එතුමා යෝජනා කළේය. ගල්කඳුරේ සිට වන්නි ආරච්චි මාර්ගයේ පස් කඩා වැටී පාර ඇහිරී ඇති බැවින් ඒවා ඉවත් කිරීමට කටයුතු කිරීම කල යුතු බව එතුමා සඳහන් කළේය.

පසුගිය සභා වාර්තා මං මුලදී ඉඳලා කියවලා බැලුවා ඇතැම් කාරනා සම්බන්ධයෙන් හිනා වෙනවද අඩනවද කියලා සිතා ගැනීමට නොහැකි බවත්, මේ වන විට රනිල් වික්‍රමසිංහ මැතිතුමා ජනාධිපති වී ඇති බවත්, එතුමා පිළිබඳව විරුද්ධ මත ඉදිරිපත් කළ ආණ්ඩු පක්ෂයට දැන් එතුමාගේ පිහිට පතන්න වී ඇති බව එතුමා සඳහන් කළේය. ඒ කොහොම වුනත් දේශපාලනයේ මේ වන විට සිදුවූ විපර්යාසය සිදුවීම සඳහා master plan එකක් ක්‍රියාත්මක වී අති බව එතුමා සඳහන් කළේය. මේ තුළින් පැහැදිලි වන්නේ කුමන හෝ පුද්ගලයෙකු ඉහළට ඔසවා තබන්නේත් බිමට ඇද දමන්නේත් මහජනතාව බව එතුමා ප්‍රකාශ කළේය. මේ සභාවේ දී සෑම විටම මහජනයා වෙනුවෙන් වගවිය යුතු බව තමන් ප්‍රකාශ කර සිටින්නේ ඒ නිසා බව එතුමා සඳහන් කළේය. මේ මන්ත්‍රීවරු සියළුම දෙනා ගම්වල ජීවත් වෙන්නේ ඒ නිසා මිනිසුන්ගේ හද ගැස්ම හොඳින් දැනෙන බව එතුමා සඳහන් කළේය. කොරෝනා නිසා මෙම තත්වය ඇති වූ බවක් පිළිගැනීමට නොහැකි බවත්, අද වන විට ඇතැම් අය සතුටින් ඉන්නවා ඇතැම් අය දුකින් ඉන්නවා කොහොම වුනත් අපේ රටේ හෙට දවස සුභ නොවන බව එතුමා පැවසුවේය. ඒ නිසාම අපි වියදම් කරන රුපියලක්ම අවශ්‍යම දේට පමණක් වියදම් කළයුතු බව එතුමා පැවසුවේය.

අදවන විට බහුතර ජනතාව ආර්ථික අතින් අර්බුදකාරී තත්වයකට පත්ව තිබෙනවා. බොහෝ පාසැල් දරුවන්ගේ කෑම වේල ඉතාම දිළිඳු බවට පත්වෙලා තිබෙන බව ඇතැම් ගුරුවරුන් හා සාකච්ඡා කරන විට දැන ගන්නට ලැබුණු බවද , මේ හේතුව නිසා අද රටේ සියළුම දේ අරපරෙස්සම් ඇතිව භාවිතා කළයුතු තත්වයට පත්ව ඇති බව එතුමා පැවසුවේය. සභාවක් හැටියට ජනතාවගේ ඡන්දයෙන් පැමිණි මන්ත්‍රීවරුන් ලෙස ඔවුන් ගෙවන බදු මුදලට සාධාරණයක් ඉටුකළයුතු බව එතුමා වැඩි දුරටත් පැවසුවේය.

**ii. ගරු මන්ත්‍රී මෝහන සුන්දරම් මහතා**

දෙහෙන කන්ද , හපුගස් කන්ද කොට්ඨාශවල ඉන්න ත්‍රී රෝද රථ රියදුරන් අසරණ වී ඇති බවත්, එහි ජනතාව සියළුම වැඩකටයුතු සඳහා රත්නපුරට පැමිණිය යුතු බවත්, බැංකුවට ආවත්, රෝහළට ආවත් කිලෝමීටර් තිහක් තිස්පහක් ප්‍රමාණයක් ගෙවා පැමිණිය යුතු බවත්, ත්‍රීරෝද රථ රියදුරන් දෙසීයක් පමන ප්‍රමාණයක් මෙම ප්‍රදේශයේ සිටින බවත්, ලීටර් පහක් ලබා දුන්නට එය උඩහට පල්ලෙහට ආවම ඒ තෙල් ප්‍රමාණය අවසන් වන බවත්, පැවසූ ගරු මන්ත්‍රීවරයා කියා සිටියේ හපුගස්තැන්න ප්‍රදේශයේ ත්‍රීරෝද රථ රියදුරන්ට ලබාදෙන තෙල් ප්‍රමාණය වැඩිකරන ලෙසත්, මේ සඳහා ග්‍රාම නිලධාරී හරහා ප්‍රාදේශිය ලේකම් වෙත දැනුම් දී ක්‍රමවේදයක් සකස් කරදෙන ලෙස ඉල්ලීමක් කරන බවද , ඒ සඳහා අවශ්‍ය කටයුතු ගරු සභාපතිතුමාගේ මැදිහත්වීමෙන් සිදුකරදෙන ලෙස එතුමා ඉල්ලීමක් කළේය. මේ ආණ්ඩුව විසින් ත්‍රීරෝද රථ රියදුරන් මහපාරට ඇද දමා ඇති බව එතුමා වැඩිදුරටත් සඳහන් කළේය.

**iii. ගරු මන්ත්‍රී ඉන්දික ලක්ෂ්මන් මහතා**

මේ වන විට විවිධ අය මොන කතා කිව්වත් ගෝඨාභය රාජපක්ෂ මහතා මේ රටේ ජනතාව කොරෝනා වුවදුරින් බේරා ගැනීම සඳහා කටයුතු කළ බවත්, කොරොනා රෝගය වැළදුන නිවෙස් වලට රුපියල් දසදහසක බඩුමල්ලක් හා එම කාලය තුළ ජනතාවගේ ජීවනෝපාය නගා සිටු වීම සඳහා රුපියල් පන්දහස බැගින් හතරවතාවක් ලබා දුන් බවත්, ලෝකයේ කිසිදු රටක් නොකරන ලද තරමේ සේවාවක් ජනයා වෙනුවෙන් එම අවස්ථාවේදී එන්නත් කරණය සිදුකරමින් කළ බව එතුමා පැවසුවේය. ඉන්දියාවේද මෙම කොරෝනා වුවදුර උත්සන්න වීමෙන් එරට ජනතාව විසින් රජයට විරෝධතා දැක්වූවත් ලංකා ආණ්ඩුවේ විපක්ෂය තරම් කුහක ආකාරයට ජනතාව උසිගන්වා කටයුතු නොකළ බව එතුමා සඳහන් කළේය. විදේශ විනිමය රටට එවන්න එපා කියලා පිටරට රැකියා කරන අයට කිව්වා. ඒවාත් මෙම අර්බුද ඇතිවීමට හේතුවක් වූ බව එතුමා පැවසුවේය.

රනිල් වික්‍රමසිංහ මැතිතුමාට නොවෙයි මුලින්ම අගමැති ධුරය බාරගන්න කතා කළේ විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස මහත්තයාට එතුමා ආසයි බයයි වගේ සිටි බවත්, මේ අර්බුදකාරී අවස්ථාවේදී රනිල්

වික්‍රමසිංහ මැතිතුමා බාර ගත්තා . රට තුළ අරගල පැවත්තුව අන්තිමට අරගලය අල කළ බවද මේ පිටුපස කුමන්ත්‍රණකාරී පිරිස් සිටි බවත්, ඒ පිළිබඳව පසුවට ජනතාව තේරුම්ගනු ඇතැයි එතුමා පැවසුවේය.

**ගරු සභාපතිතුමා විසින් ගරු උප සභාපතිතුමා වෙත මූලාසනය බාරකරමින් සභා ගර්භයෙන් ප.ව.12.30ට පමණ පිටවී ගියේය.**

**iv. ගරු මන්ත්‍රී පත්මා නන්දනී මහත්මිය**

රනිල් වික්‍රමසිංහ මැතිතුමා අග්‍රාමාත්‍යතුමා වීම පිළිබඳව කිසිදු විවාදයක් නොමැති බවත්, රටතුළ මේ තත්වයට පත්වීම පිළිබඳව කවුරුත් දන්නා කාරණයක් බවද එතුමිය පැවසුවේය. හැට නව ලක්ෂය තුළ සියළුම පක්ෂ නියෝජනය වුනා. මේ තුළින් රටට යම්කිසි සෙතක් වෙයි කියන බලාපොරොත්තුව තිබුණත් එසේ සිදුවුයේ නැහැ,තෙල් පෝලිම් , ගෑස් පෝලිම් ඇති වීම පමණක් සිදුවූ බව එතුමිය පැවසුවේය. යහපාලන ආණ්ඩුව කාලේ තුන්වේල කාල සිටියත් අද ජනතාවට තුන්වේල කන්න බැරි වෙලා තිබෙනවා. දෙහෙන කන්ද සිට අද වන විට ත්‍රීරෝද රථයක් රත්නපුරට පැමිණෙන්න රුපියල් 8000.00ක් ගන්නා බවත් පැවසුවේය.

එක්සත් ජාතික පක්ෂයේ නියෝජිතයෝ හැටියට තමයි මුලින්ම පත්වුනේ රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ සංකල්පයකට අනුව 25% කාන්තා නියෝජනය ඇතිකළ නිසා තමයි අපිටත් ඡන්දෙන් පත්වීමට හැකියාවක් ලැබුනෙ. ඒ නිසා රනිල් වික්‍රමසිංහ මහතා විසින් මේ ක්‍රමවේදය වෙනස් කිරීමක් සිදුකර රටට යහපතක් සිදුවනවානම් තමන්ට කිසිදු කුහක චේතනාවක් නොමැති බව එතුමිය පැවසුවාය.

පක්ෂ පාට භේදවලින් තොරව රටේ හෙට දවස පිළිබඳව අවිනිශ්චිත තත්වයක් තිබෙන බවත්, රටේ දරුවන්ගේ යහපත ඇතුව රටේ නායකයින් ඉදිරියේ දී කටයුතු කළ යුතු බවත්, ඉදිරියේදී එවැනි නායකත්වයක් ජනතාව විසින් තෝරා ගැනීමට ලක්කළ යුතු බව එතුමිය පැවසුවාය.
සියළුම පක්ෂ එකතුවෙලා මේ රට පත්වෙලා ඇති තත්වයෙන් මුදවා ගැනීමට කටයුතු කළයුතු බව එතුමිය පැවසුවාය.

මෝහන් මන්ත්‍රීතුමා සඳහන් කළා වගේ දෙහෙන කන්ද සිට රත්නපුර දක්වා පැමිණීමට පෙට්‍රල් ලීටර් හතරක් පමණ යනවා.තෙල්වල ප්‍රමිතියේද වෙනසක් ඇති බවත්, ගෙදරින් පෙට්‍රල් ලීටර් හතරක් පහක් හොයගෙන තමයි තෙල් ගහන්න එන්න වෙන්නෙ නමුත් තෙල් ගහගන්න බැරි වුනොත් ආපහු යාමට හැකියාවක් නොමැති බවත්, එම ප්‍රදේශවල ත්‍රීරෝද රථ රියදුරන් මෙම ගැටළුව නිසා අපහසුතාවයට පත්ව ඇති බව එතුමිය පැවසුවේය.එසේම මේ ප්‍රදේශවල සිට පැමිණෙන ජනතාව ඉතාමත් ප්‍රවාහන අපහසුතා මධ්‍යයේ බස් රථවල ගමන් තරන බව එතුමිය සඳහන් කළේය.

ඉහළ දෙහෙන කන්ද ප්‍රදේශයේ මාර්ගයක් වර්ෂාව නිසා අබලන් තත්වයට පත්ව ඇති බවත්, එය කඩිනමින් දෙන ලෙසත් එතුමිය පැවසුවේය.

**iv.ගරු මන්ත්‍රී අනුර ප්‍රභාත් අමරවංශ මහතා**

පසුගිය හංවතුර හේතුවෙන් දකුණු ගිලීමලේ වසමේ ගෙවල් 30ක් පමණ හංවතුර ආපදාවකට ලක්වුනා.මේ පාර හංවතුර තත්වයක් වෙනත් කාලවල එන හංවතුරට වඩා විශාල ලෙස හානියට පත්වුනු තත්වයක් බව එතුමා පැවසුවේය. මෙම හංවතුර තත්වය ස්වාභාවිකව ආ තත්වයක් නොවන බවත් එතුමා පැවසුවේය.

ගැබිනි මව්වරුන්ගේ පෝෂණ මළු මේ වන විට ලැබී නොමැති බවත්, එය ලබා නොදීම තුළ ගැබිනි මව්වරුන්ගේ පෝෂන තත්වය පහළ යා හැකි බැවින් එම පෝෂණ මළු නැවත ලබා දීමට කටයුතු කළයුතු බව එතුමා පැවසුවේය.

මෙම සභාව තුළ කතා බහට ලක් වූ රනිල් වික්‍රමසිංහ ජනාධිපතිතුමාගේ දේශපාලනය විවේචනය කළ කටවල් වලින්ම එතුමාගේ ගුණ වර්ණනා කිරිමට සිදුවීම දෛවයේ සරදමක් බව එතුමා පැවසුවේය.
මහජනතාවගේ ඇත්ත ගැටළු පිළබඳව විසඳීම සඳහා අරගලයට යොමු වීම ඉදිරියේ දී සිදුවන බවත්, අරගලය අවසන් නොමැති බවත් පැවසුවේය.

පොහොර ගැටළුවට විසඳුම් සෙවීම සඳහා රත්නපුර දිස්ත්‍රික්කයේ පාර්ලිමේන්තු මන්ත්‍රී වරුන්ට අරගලයක් කළ හැකිව තිබූ කාලයක වුවද ඔවුන් එසේ නොකළ බවත්, මහජනතාවගේ ප්‍රස්න සඳහා පිළිතුරු නොලැබෙන විට අරගල සඳහා ජනතාව යොමු වුන බවත්, ඉදිරියේදීත් ජනතාවගේ ප්‍රශ්ණ වෙනුවෙන් විසඳුම් ලබා ගැනීම සඳහා අරගලයේ යෙදීමට තම පක්ෂය කටයුතු කරන බව එතුමා වැඩිදුරටත් සඳහන් කළේය.

**v.ගරු මන්ත්‍රී ලලිත් බෝතුංග ආරච්චි මහතා**

සමෘද්ධි වැඩසටහන හරහා රුපියල් පන්දහසක හා දසදහසක දීමනාවක් පසුගිය දිනවලදී ලබාදුන් බවද, මේ දිනවල සහනාධාර වශයෙන් සහල් කිළෝ 10ක ප්‍රමාණයක් ලබාදෙනවා.සමෘද්ධි වැඩසටහන හරහා සිදුවන වැඩසටහන පිළිබඳ කිසිදු අවස්ථාවක කිසිදු දේශපාලකයෙකු කතා නොකරන බවත්, සියළුම සමෘද්ධි කොට්ඨාශවල ජනතාවට සිදුකරන අසාධාරණ කම් සියල්ලම සිදු කරන බව එතුමා සඳහන් කළේය. මේ අවස්ථාවේදී අන්ත අසරණ වී ඇති මිනිසුන්ට සහනාධාර ජනාධිපති වෙනස් වුනාට වෙනස් කළයුතු නැත යනුවෙන් එතුමා පැවසුවේය. අහිංසක මිනිසුන්ට කරන අසාධරණය පිළිබඳ සොයා බලන ලෙසත්, රත්නපුර ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයේ සමෘද්ධි සංවර්ධන නිලධාරීන් විසින් සිදු කරනු ලබන අසාධාරණකම් පිළිබඳව සොයා බලන ලෙස ගරු මන්ත්‍රීවරයා ඉල්ලීමක් කළේය.

රත්නපුර ශ්‍රී පලාබද්දල මාර්ගය මේ වන විට ගමනාගමනය කළ නොහැකි තත්වයටම පත්වෙමින් පවතින බවත්, මෙම මාර්ග 2018 වසරේදී රනිල් වික්‍රමසිංහ මැතිතුමා අගමැති වශයෙන් කටයුතු කළ කාලයේදී මුල් ගල් තියා වැඩ ආරම්භ කළා. මුල් කාලයේදී වැඩ කඩිනමින් සිදුවුනා නමුත් ආණ්ඩු මාරුවත් සමඟ වැඩ කටයුතු ඇන හිටියා මේ වන විට එම මාර්ගයේ යා නොහැකි තත්වයටම පත් වී ඇති බව එතුමා පැවසුවේය. ජනාධිපතිතුමා වෙත මේ පිළිබඳව මාර්ගය සංවර්ධනය කල හැකිද යන්න විමසා ලිපියක් යොමු කරන ලෙසද ඉල්ලීම් කළේය. එසේම විශාල වලවල් කිහිපයක් තියෙනවා තාවකාලිකව පස් ටිකක් හෝ යොදා සකස් කරන ලෙස මාර්ග සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ වෙත දැනුම්දෙන ලෙස එතුමා පැවසුවේය.

තමන්ගේ නායකයා කවුද යන්න මේ සභාවේදී කිහිප අවස්ථාවක තමන් ප්‍රකාශ කර ඇති බවත්, එය නැවත නැවත විමසීම සුදුසු කාරණයක් නොවන බවත්, තමන්ද එය නැවත නැවත ප්‍රකාශ කර සිටීමට බැඳී නැති බවත්, එතුමා පැවසුවේය. සජිත් ප්‍රේමදාස මහතා අගමැති කම බාරගත්තානම් එතුමා පෞද්ගලිකව කතා කරපු රටවල් වලින් උදව් ලැබෙන කොට ජනතාවගේ ප්‍රශ්ණ විසඳෙනවා .එහෙම වෙනකොට ගෝඨාභය මහත්තයාට ඉන්න හැකි රටක් නිර්මාණය වන බව එතුමා පැවසුවේය. දැන් ඉන්න ජනාධිපතිතුමාට යන්න කියන්න බැහැ මොකද හිටපු තත්වයට වඩා රට පහළට දමා නොමැති බවත්, මහජනතාවට වගවෙන, වගකීමක් නොදරන කෙනෙකුට ජනාධිපති ලෙස කටයුතු කරන්නේ කෙසේද යන්න තේරුම් ගතයුතු බවත්, සජිත් ප්‍රේමදාස මහතාගේ වැඩපිළිවෙළ පිළිබඳව තමන් දන්නා බවත්, අද වන විට පත්වී ඇති නායකයා එවකට තම පක්ෂයේ නායකයා බැවින් තමන්ට ගැටළුවක් නොමැති බවද එතුමා පැවසුවේය.

**vi.ගරු මන්ත්‍රී විජය ශ්‍රී ශාන්ත මහතා**

පසුගිය දිනවල ලබාදුන් සහල් දහයක් ලබා දීමේ වැඩ සටහනේදී ලබා දී ඇත්තේ සමෘද්ධි ලාභීන්ට හා පොරොත්තු ලේඛනයේ සිටින අය වෙතයි. මෙම ගැටළුකාරී තත්වයන් ඇති වී තිබෙන්නේ රත්නපුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පමණක්ද යන්න සොයා බැලිය යුතු බවත්, අනෙකුත් බොහෝ කොට්ඨාශවල නිවැරදිව මේ කටයුතු සිදුවූ බවට තොරතුරු ඇති බවයි. ඇතැම් නිලධාරීන් සිතා සිටින්නේ ගෝඨාභය මහත්තයා ගියාම පහළ සිටින පිරිසත් අයින් වුනා කියලා නමුත් ජනතාවගේ ප්‍රශ්ණ විසඳීම සඳහා ප්‍රාදේශිය මහජන නියෝජිතයින් තවමත් සිටින බව එතුමා පැවසුවේය. පක්ෂ භේදයෙන් තොරව මේ සහල් ලබා දීය යුතුවෙනවා. සෑම කොනෙකුටම මෙය ලැබිය යුතුයි. නමුත් මේ සෑම දෙනාටම නොලැබෙන බව දැනගන්නට ලැබෙන බවත්, මේ සඳහා මන්ත්‍රීවරුන් මැදිහත් වී සාධාරණයක් ඉටු නොකරන බවටත් ජනතාව තුළ ආකල්පයක් ඇති බව එතුමා පැවසුවේය. ඒ නිසා මේ පිළිබඳව සොයා බලා කටයුතු කරන ලෙස ගරු සභාපතිතුමාගෙන් ඉල්ලීමක් කරන ලදී.

මහ බැංකුව මංකොල්ලයේදී දැන් හිටපු නායකයා හිටියා.ඒ අවස්ථාවේදී පහළ සිට ප්‍රාදේශීය නියෝජිතයින් සියළුම දෙනාට මුදල් ලබා දුන්නා ඡන්දය අවස්ථාවේදී , සජිත් ප්‍රේමදාස මහතා මුදල් අමාත්‍යවරයා හැටියට සිටියදී විශාල වශයෙන් මහජන මුදල් අවභාවිතා කළ බවත්, කවුරුන් හෝ සොරකම් කර ඇත්නම් එය අනුමත නොකරන බවත්, මහින්ද රාජපක්ෂ මහතා වුනත් සොරකම් කළානම් එය අනුමත නොකරන බව ගරු මන්ත්‍රීවරයා පැවසුවේය. අද තිබෙන අර්බුදය සඳහා සියළුම දෙනා වගකිවයුතු බව එතුමා පැවසුවේය. ව්‍යවසායකයින් නිර්මාණය නොකර රටේ තරුණ පිරිස ත්‍රීරෝද රථ රියදුරන් ආදී වශයෙන් විවිධ රැකියාවල නිරත වීම තුළින් යම්කිසි නිෂ්පාදනයක් සිදුනොවන බවත්, ඒ තුළින් රටේ සංවර්ධනය සිදු නොවන බව එතුමා සඳහන් කළේය. කවුරුන් රටපාලනය කළත් සිස්ටම් චේන්ජ් කිරීම සඳහා අවුරුදු 13ක් ගත වන බවත්, ඒ සඳහා අධ්‍යාපන ප්‍රතිසංස්කරණයන් සිදුවිය යුතු බව එතුමා සඳහන් කළේය. සෑම දෙනාම වෛද්‍යවරුන් හා ඉංජිනේරුවන් වීමට උත්සහ කරනවා වෙනුවට වෙනත් වෘත්තීන් කරා තරුණ පිරිස යොමු කරවීමට කටයුතු කළයුතු බව එතුමා පෙන්වා දුන්නේය.

ජනතා විමුක්ති පෙරමුණ හෝ ජනතා විමුක්ති පෙරමුණේ ගර්භාෂය තුළ හැදිච්ච පෙරටුගාමීන්ට මේ පත්වන කිසිදු පාලකයෙක් අවශ්‍ය නොමැති බවත්, මෙම ප්‍රශ්ණ සියල්ල විසඳීම සඳහා ඔවුන් බලයට පත්වෙනකම් සිටිය යුතු බව එතුමා පැවසුවේය. අරගලය හොඳ බවත්, දැන් අරගලයට අයිතිකරුවෙක් නොමැති බවත්, අපිට බීමේ හොඳ තත්වයක් තියෙනවා කිය කියා සිටිය හැකි බවත්, ඉදිරියේදී 3%ත් නැති වෙන බව එතුමා පැවසුවේය. ගෝඨාභය රාජපක්ෂ මහතාගේ වැඩපිළිවෙල මේ රටට නොගැළපුණ බවත්,

එය සිදු කිරීමට අපේ පක්ෂයේ පිරිසක්ද විරුද්ධ වී සිටි බව එතුමා පැවසුවේය. රටේ ප්‍රශ්ණ තිබෙන බවත්, එම ප්‍රශ්ණ වලට විසඳුම් සොයමින් ඉදිරියට යා යුතු බව එතුමා පැවසුවේය.

**vii.ගරු මන්ත්‍රී සමන් පාලිත මහතා**

සමෘද්ධි ප්‍රතිලාභ ලබා දීමේදී ග්‍රාමීය කමිටු මගින් සකස් කර රුපියල් පන්දහස ලබා දීමේදී සාධාරණ ආකාරයට බෙදා දීම සිදු වූ බවත්, එහෙත් මෙවර සහල් බෙදා දීම වැඩසටහනේදී පසුගිය ලැයිස්තුවෙන් නම් කිහිපයක් ඉවත් වී ඇති බවත්, පොරොත්තු ලේඛනය නිවැරදි ලෙස සකස් වී නොමැති බවත්, එම ලේඛන සකස් වන්නේ සමෘද්ෂි සමිතිවල ලේකම්, සභාපතිට අවශ්‍ය ආකාරයට බවත්, එය නිවැරදි නොවන බවත්, කොට්ඨාශයේ මන්ත්‍රීවරයාගේ මැදිහත් වීමකින් තොරව ලබා දීමේදී මෙම ප්‍රතිලාභ නිවැදි පුද්ගලයන්ට නොලැබෙන බවත්, පාගොඩ කොට්ඨාශයේ මෙම ගැටළු ඇති වී ඇති බවත්, මේ පිළිබඳව ප්‍රාදේශිය ලේකම් වෙත දන්වා යවන ලෙස ගරු මන්ත්‍රීවරයා සඳහන් කළේය.

ප්‍රභාත් මන්ත්‍රීවරයා කෙසේ කීවත් රජය මොන තත්වයක සිටියත් මන්ත්‍රීවරයෙක් ලෙස තමන්ට ගමේ ජනතාව අතරට යෑමට කිසිදු ප්‍රශ්ණයක් නොමැති බවත්, තමන්ට තිබූ පිළිගැනීම එළෙසම තිබෙන බවත් ඔහු පැවසුවේය.

**viii. ගරු උප සභාපති ජී.ජී.ජානක පුෂ්පකුමාර මහතා**

අද දින මහා සභාවට පැමිණි සියළුම දෙනාට ස්තූතිවන්ත වන බවත්, සමෘද්ධී ප්‍රතිලාභීන්ට සිදුවනවායැයි කියන අසාධාරණය පිළිබඳව සොය බලා කටයුතු කරන බවත් පැවසූ එතුමා වැඩි දුරටත් කියා සිටියේ ගරු මන්ත්‍රීවරුන් පැවසූ ගැටළු කාරී තත්වයන් පිළිබඳව සොයා බලා අවශ්‍ය විසඳුම් ලබා ගැනීමට කටයුතු කරන බවයි. ඒ අනුව සභාවේ කටයුතු අවසන් කරන ලදී.

**ඩබ්ලිව්.ඩී.සුදත් දිසානායක**
**සභාපති**
**රත්නපුර ප්‍රාදේශිය සභාව**